**බේස් ලයින් මාර්ග ව්‍යාපෘතිය අදියර III - 2019**

**------------------------------------------------**

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතිය - අදියර III 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.මෙම ව්‍යාපෘතිය 2009 නොවැම්බර් 19 දින පවත්වන ලද කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ගත් තීරණයක් යටතේ ක්‍රියාත්මක කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**---------------------------------------------------------------**

එවකට මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කිරුළපන සිට කොළඹ හොරණ මාර්ගය දක්වා මීටර් 860 ක් දිග නව මාර්ගයක් ඉදි කිරීම මඟින් මාර්ග තද බදය අවම කිරීමයි.ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීමේ ඇස්තමේන්තු ගත පිරිවැය රු: මිලියන 3,500 ක් වන අතර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ඉදිකිරීම් පිරිවැය රු:මිලියන 7,041.29 විය.

## 1.3 තත්ත්වාගණනය කල මතය

**----------------------------**

මාගේ වාර්තාවේ 2 වගුවේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**--------------------**

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරිම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පරිදි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්,අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම,ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

**2.** **මූල්‍ය ප්‍රකාශන මත අදහස් දැක්වීම**

----------------------------------

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරන ලදි.

----------------------------------------

| | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම | බලපෑම් | කළමණාකරනයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------- | -------------------- | -------------------- |
| | | රු.මිලියන | | | |
| (අ) | ඉඩම් කට්ටි 31 ක් සඳහා රු.මිලියන 7.57 ක් ගෙවිය යුතු වන්දි මත පොළිය සඳහා වෙන්කිරීමක් ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ සිදුකර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්වන රු.මිලියන 211.45 ක ගෙවිය යුතු පොළිය රු.මිලියන 7.57කින් අඩු වී තිබුණි. | 7.57 | වගකිම් අඩුවෙන් දැක්වීම. | එකඟ වේ. මෙම මඟහැරිම දැන් නිවරැදි කර තිබේ. | ප්‍රවර්ථන වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ශේෂයන් නිවැරදිව ගිණුම් වලට ගත යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන තුල පෙන්වන ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි වටිනාකම සහ විගණනයට ඉදිරිපත් කරන ලද වන්දි උපලේඛනයේ පෙන්වන වටිනාකම අතර රු.මිලියන 7.37 ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි. | 7.37 | මූල්‍ය ප්‍රකාශන තුල වැරදි තොරතුරු ඇතුලත් විය හැක. | එකඟ වේ.මෙය සිදු වුයේ ප්‍රමාද දෝෂයක් හේතුවෙනි.<br>රඳවා ගැනීමේ බදු මුදල මේ වන විට වන්දි මත පොලී ගිණුමට මාරු කර තිබේ. | මූල්‍ය ප්‍රකාශනයේ උපලේඛනයන් මූල්‍ය ප්‍රකාශන තුල පෙන්වන වටිනාකම් වලට එකඟ විය යුතු වේ. |

**3.** **කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරන ලදි.

| | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------------- | ------------- | ------------------------- | -------------------- |
| (අ) | කිලෝ මීටර් 7.42 ක දිගකින් යුතු කිරුළපන සිට රත්මලාන මැලිබන් හන්දිය දක්වා වූ බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ 03වන කොටසේ | අපේක්ෂිත ප්‍රතිලාභයන් සම්බන්ධිත පාර්ශවයන්ට නොලැබී යාම සහ ව්‍යාපෘතියේ පිරිවැය ඉහළ යාමේ හැකියාව. | සිවිල් වැඩ සඳහා අරමුදල් ඉල්ලීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරිමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු 2004 අගෝස්තු 12 වන දින අමාත්‍යමණ්ඩලයේ අනුමැතිය අනුව 2004 වර්ෂයේදී ආරම්භ කර තිබුණි.කෙසේ වෙතත් 2009 මැයි 21 වන දින කැබිනට්අමාත්‍යවරුන්ගේ අනුමැතිය අනුව,ව්‍යාපාතියේ විෂය පථයට අයත් කාර්යයන් කිරුලපන හයිලෙවල් මාර්ගයේ සිට කොළඹ හොරණ මාර්ගය දක්වා කිලෝමීටර් 0.86 කින් අඩු කර තිබුණි. කෙසේ වෙතත් ඉහත ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.තවද,ව්‍යාපෘතිය විසින් සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනයන් මේ දක්වා සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | ප්‍රදේශයෙන් 75% ක ඉඩම් අත්පත් කර ගැනීමෙන් තොරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඊළඟ පියවර ක්‍රියාත්මක කිරීමට නොහැක. එම හේතු නිසා සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්කරවකු තෝරා ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරිමේ හැකියාවක් නොමැත. | |
| (ආ) | ඉඩම් හිමිකරුවන් 15 ක් සඳහා මුළු වන්දි මුදල් වල එකතුව රු.මිලියන 699.25 ක් වූ අතර මෙයින් ඉඩම් හිමිකරුවන් 03 කට රු.මිලියන 230 ක වන්දි මුදල් පමණක් ප්‍රවර්ථනවර්ෂය තුළ පියවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 දෙසැම්බර් 31 වන විටත්, ව්‍යාපෘතියේ අරමුදල් පහසුකම් වල හිඟය නිසා ඉඩම් කැබලි 12 ක අයිතිකරුවන්ට අදාළව රු.මිලියන 469.3 ක වන්දි මුදලක් නොපියවා තිබුණි. ඊට අමතරව වන්දි මුදල් පියවීම ප්‍රමාද වීම නිසා 2019 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රකාශන තුල රු.මිලියන 211.45 ක වටිනාකමින් යුත් 7% ක පොළියක් දක්වා තිබුණි. | වන්දි ඉල්ලීම් පියවීම ප්‍රමාද වීම නිසා ගෙවීමට සිදුවන පොලිය වැඩිවිය හැකිය. | එකඟ වේ.රජයේ සීමිත අය වැය නිසා,ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් නියමිත වේලාවට ව්‍යාපෘතිය වෙත නොලැබුණි.වන්දි ගෙවීම ප්‍රමාද වීම නිසා 2015 ජනවාරි සිට 7% අමතර පොළියක් ගෙවීමට ඇත. | ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) සංශෝධිත විෂයපථය අනුව ඉඩම් කැබලි 200 ක් අත්පත් කළ යුතු වුවත්,ව්‍යාපෘතිය සමස්ත ප්‍රමාණයෙන් සියයට 15 ක් නියෝජනය කරන ඉඩම් කැබලි 31 ක් පමණක් අත්පත්කරගෙන තිබූ අතර 2019 දෙසැම්බර් 31 වන විට රු මිලියන 675 ක වන්දි ගෙවා තිබුණි. | බෙස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය හැකිය. | ව්‍යාපෘතියට අයත් ඉඩම් කට්ටි 200 න් 2019 දෙසැම්බර් 31 වන විට සියයට 31 ක් 2020 ජූනි 30 වන විට සියයට 39 ක ප්‍රතිශතයක් ව්‍යාපෘති ප්‍රදේශයන් නිරවුල් කර තිබුණි. 2020 ජූනි 30 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ සමස්ත කාර්යය සාධනය සියයට 79 කි. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන අරමුදල් සීමා කිරීම ව්‍යාපෘතියේ ප්‍රගතියට සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබේ. | සමස්ත සැලැස්ම සැලකිල්ලට ගනිමින් ලඟා කර ගත හැකි ඉලක්ක සැකසීමට තීරණය කළ යුතු අතර ,ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලා සිටිය යුතුය. |